

# මුහුදු බෙල්ලන් මෙතරම් වටින්නේ ඇයි?



**මුහුදු බෙල්ලන් අපෘෂ්ඨ වංශිකයින්ය. මෙම මුහුදු බෙල්ලන්ගේ ඇතැම් බෙල්ලන් දුර්ලභ සත්ව විශේෂ වෙයි. එවන් වූ බෙල්ලන් ප්‍රසිද්ධියේ ද අප්‍රසිද්ධියේ ද විවිධ මිල ගණන් යටතේ අලෙවි කරති. මේ පසුගිය වසරවල වාර්තා වූ නීති විරෝධී බෙල්ලන් ජාවාරමේ සුළු තතු ප්‍රමාණයකි.**

2017 වසරේදී මඩකළපුව ප්‍රදේශයෙන් කෝටි 70 ක් වටිනා වාලම්පුරි තොගයක් විශේෂ බළකා සෙබළුන් අතට පත් විය. ඉන් පසු විශ්වමඩු ප්‍රදේශයේ ධර්මපුරම් ගමෙන් වාලම්පුරි ලෙස සැක කළ හැකි ට්‍රයිටන් වර්ගයේ බෙල්ලන් ප්‍රමාණයක් පොලිස් අත්අඩංගුවට පත් විය.

ඊටත් පසු අඩි 1 යි. අඟල් 3 ක් දිගැති වාලම්පුරියක් රුපියල් ලක්ෂ 60 කට අලෙවි කිරීමට තැත්කරද්දී ත්‍රිකුණාමල පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබුණේය.

ඉන් පසු නැවතත් ත්‍රිකුණාමල ප්‍රදේශයෙන් රුපියල් කෝටියකට අලෙවි කිරීමට නියමිත වාලම්පුරි තොගයක් සොයා ගැනීම සිදු විය.

තවද මෙම වාලම්පුරි ජාවාරමේ බෙදවාචකයක් ලෙස සිදු වන පණ පිටින් සිටින ට්‍රයිටන් බෙල්ලෝ අල්ලාගෙන විත් අධිශීතකරණවල දමා මරණයට පත් කර අලෙවි කිරීමේ ස්ථානයක් ද වලාන දූෂණ මර්දන ස්ථානයෙන් වටලන ලද්දේ ද 2018 වසරේදීමය.

දුර්ලභ මුහුදු බෙල්ලන් අලවිය තහනම් වන අතර ඒ සඳහා වූ නීතිය එලෙසින් ක්‍රියාත්මක වෙද්දී ප්‍රසිද්ධියේම ඇතැම් පුද්ගලයෝ මුහුදු බෙලි ජාවාරම සිදු කරමින් සිටිති. එහි එක් ප්‍රතිඵලයක් ලෙස 2019 වසර උදාවීමත් සමගම තලවතුගොඩ නමෝ නාරායන ආයතනය විසින් පවත්වා ගෙන ගිය වාලම්පුරි ජාවාරම පොලිස් ඇසට හසු විය. එනම් ව්‍යාපාර දියුණුව, අපල දුරු කිරීම, ලෙඩ රෝග සුව කිරීම ආදී අවස්ථා මතු කරමින් ඊට විසඳුම් ලෙස, වාලම්පුරි අලෙවි කළ (පසුව ව්‍යාජ වාලම්පුරි බව ඔප්පු වූ) කීර්ති දිසානායක නමැත්තා අත්අඩංගුවට ගත්තේය. එහිදී රුපියල් ලක්ෂ ගණන්වලට වාලම්පුරි අලෙවි කර ඇති බවත් අනාවරණය වූවේය.

සැබැවින්ම වාලම්පුරි යනු කුමක්ද? මිනිසුන් ලක්ෂ කෝටි ගණන් වියදම් කර ඉන් සෞභාග්‍යය උදා කර ගන්නේ කෙසේද? පණපිටින් සිටිනා සතෙකු මරා මාංශ ආහාරයට ගෙන එම සතාට ආරක්ෂාව ලබා දුන් ආවරණයෙන් මිනිසාට සෞභාග්‍ය ලබා ගත හැකිද? මිනිසුන් මෙම මුහුදු බෙල්ලන්ගේ කවචයක් වටිනා මිල ගණන්වලට මිලදී ගන්නේ ඇයි? විශේෂ බෙලි කවචයකට අසීමිත මිලක් නියම වීම පිටුපස ඇති වෘත්තාන්තය කුමක්ද? යන සියලු ප්‍රශ්නාර්ථයන්ට බලපා ඇති සමාජමය හේතු මෙසේ අනාවරණය කරමු.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර මුහුදු කලාපයේදී මොලස්කා වංශයට අයත් මුහුදු බෙල්ලන් බහුලව දක්නට ලැබෙන්නේය. විශේෂයෙන්ම මේ වර්ගයට අයත් සත්ව විශේෂ ලක්ෂයක් පමණ මේ වන විට හඳුනාගෙන ඇත.

ගැස්ට්‍රෙපෝඩා යනු මින් එක් වර්ගයකි. මෙම වර්ගයට අයත් සත්ව විශේෂ හැටදහකට අධික ප්‍රමාණයක් ඇත්තේය.

මෙම මුහුදු බෙල්ලන් අතර මූල්‍යමය අතින් වඩා වටිනාමක් හිමිව ඇත්තේ ට්‍රබියුලා පයිරම් (Terbiulla Pyrum) වර්ගයටය. අද වාලම්පුරි ලෙසින් අලෙවි වෙන්නේ මෙම වර්ගයේ මුහුදු බෙල්ලන්ය.

මෙම මුහුදු බෙල්ලන් වර්ගයෙන් ලක්ෂයකට එකක් පමණ දක්ෂිණා වෘත්තය සහිත කවචයකින් දක්නට ලැබෙන්නේය. මේවා මිල අධික වාලම්පුරි ලෙස මිනිස්සු පිළිගනිති.

විශේෂයෙන්ම සෞභාග්‍යයේ සංකේතයක් ලෙස වාලම්පුරි සැලකීම අතීතයේ සිටම පැවත එන විශ්වාසයකි.

මීළඟට කැරිබියන් මුහුදේ ජීවත් වන බෙල්ලන් විශේෂයක් වන ටර්බිනෙල්ලා ඇන්ගියුලේටාගේ කවචයට ද අද විශේෂ වෙළෙඳපොළක් සැකසී ඇත්තේය. මේවා ද අධික මිල ගණන්වලට අලෙවි වෙයි.

ප්‍රකටව හා අප්‍රකටව කරගෙන යන මුහුදු බෙල්ලන්ගේ ජාවාරමේ විශේෂ කවචවල මිල ගණන් සැදෙන්නේ මෙසේය.

ට්‍රයිටන් වර්ගයට අයත් බෙල්ලන් වාලම්පුරි ලෙස අලෙවි කරන අතර එය ගෞරී වාලම්පුරි සහ ලක්ෂ්මි වාලම්පුරි ලෙස දෙවර්ග වෙයි. ලක්ෂ්මි වාලම්පුරි මිලෙන් අඩු වන අතර රුපියල් 5000 සිට 70,000 දක්වා මිල ගණන්වලට අලෙවි වන්නේය.

ගෞරී වාලම්පුරිය මිලෙන් අධිකය. එයට හේතුව එහි ඇති දුර්ලභත්වයයි. හොඳම ගෞරී වාලම්පුරියක් එහි බර අනුව අලෙවි වන්නේය. විශේෂයෙන්ම ලක්ෂ 60 ට 70 ට යන අවස්ථා ඇත.

මෙම වාලම්පුරි දෙවර්ගයේ මිල තීරණය වෙන්නේ එහි බර, දිග, පෙනුම යනාදී හේතු සාධක මුල් කරගෙනය.

බෙල්ලන් අල්වාගෙන මස් අනුභව කර කවචය අධික මිල ගණන්වලට අලෙවි කර උදා කර ගත හැකි සුබ ඵලය කිමෙක්ද?

උස් මනසක් ඇත්තෙකු ලෙස සලකන මිනිසා සිතිය යුතු යථාර්ථය එයයි. කෙසේ වුවද මුහුදු ජීවීන් වන මෙම බෙල්ලන් විශේෂ පිළිබඳ විද්‍යාත්මක තතු හා සමාජය ගොඩනගා ගෙන ඇති මූල්‍යමය වටිනාකම්වලට බලපා ඇති හේතු පිළිබඳ කතා කිරීමට නාරා ආයතනයේ සමුද්‍ර ජීවි විද්‍යා අංශයේ විද්‍යාඥ මධුර වීරසේකර මහතා සම්බන්ධ කර ගත්තෙමු.

වාලම්පුරි කියන්නේ ලක්ෂයකට අවස්ථාවක්. ඒක නිසයි එයට වටිනාකමක් තිබෙන්නේ. වාලම්පුරි විද්‍යාත්මක නාමයක් නෙමෙයි. මිනිස්සු තමයි ඒ නම තබාගෙන සෞභාග්‍යය උදා වෙනවා කියලා විශ්වාසයෙන් කටයුතු කරන්නේ. මේවා වටින්නේ දුර්ලභ නිසයි. නැතිව වාසනාව ගෙන දෙනවා කියා විද්‍යාත්මකව තහවුරු කිරීමක් නම් මෙහි නෑ.

මීට අමතරව මෑතක දී නීතියට හසුවූවා ට්‍රයිටම් වර්ගයේ රවුම් රවුම් බතික් කළා වගේ ලස්සන බෙල්ලෙක්. එය දුර්ලභයි. ඊට වම දකුණ ප්‍රශ්නයක් නෑ.

ඒ නිසා එය ලක්ෂ 50 ට 60 ට අලවි වන බව අසන්නට ලැබෙනවා. ළඟදීත් එකක් අල්ලලා තිබෙනවා. මෙය සංරක්ෂිත බෙල්ලෙ 2009 සංශෝධිත වෘක්ෂලතා ආඥාපනතින් මොලුස්කා වංශිකයින් පිළිබඳ කතා කරලා තිබෙනවා. ඊට බෙල්ලනුත් අයිති වෙනවා. එහිදී විශේෂයෙන් සඳහන් කරලා තිබෙනවා. දුර්ලභ බෙල්ලන් විශේෂයක් වන ගැරෝනියා ට්‍රයිටන් සංරක්ෂිත බෙල්ලෙක් කියන එක. එවැනි දෙයක් ළඟ තබා ගැනීම, ප්‍රවාහනය හා අලෙවිය නීතියෙන්ම තහනම් කර තිබෙනවා.

මේ බෙල්ලෝ ලොකු මිල ගණන්වලට මිලදී ගන්නේ සෞභාග්‍යය ලැබෙනවා කියන විශ්වාසය නිසයි. රුපියල් 5000 ගණන්වලට අලෙවි කරන්නේ විසිතුරු භාණ්ඩවලට.

මේ ජාවාරම් නිසා වැඩිපුර හානි සිදුවන්නේ දුර්ලභ සත්ව විශේෂවලටයි. ඒ සඳහා දඬුවම් නියමිතයි. ඒ වගේම බෙල්ලන් යමෙකුට ආවාට ගියාට ප්‍රවාහනය කරන්න බෑ.

2009 සංශෝධිත වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ මේ පිළිබඳ සඳහන් වෙනවා.

මීට අමතරව බෙල්ලෝ ප්‍රවාහනය හා සංරක්ෂණය සම්බන්ධව 96 ධීවර ජලජ සම්පත් පනතේ 71 වැනි වගන්තියේ අංක 1780/31 හි 2012 ඔක්තෝබර් 2 අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කර තිබෙනවා.

සටහන - කුමාරි හේරත්